ජනතා විමුක්ති පෙරමුණේ "හෘදසාක්ෂිය"

ගරුතර සංඝයා වහන්ස, පූජකතුමනි, සහෝදරය, සහෝදරිය,

ජනතා විමුක්ති පෙරමුණ මෙවර පාර්ලිමේන්තු ඡන්ද සටනේ දී ඡන්දදායකයාට තමන්ගේ "හෘදසාක්ෂිය" පෙන්වා ඡන්දය දෙන ලෙස ඉල්ලයි. හෘදසාක්ෂියට අනුව සිතීම, කතා කිරීම සහ වැඩ කිරීම යනු තමන්ගේ හිතට එකඟව සිතීමයි, කතා කිරීමයි සහ වැඩ කිරීමයි. මේ පත්‍රිකාවේ අරමුණ ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධයෙන් ඔවුන් පෙන්වන හෘදසාක්ෂිය ගැන ඔබට ඔබේ හෘදසාක්ෂියට අනුව සිතන්නට යමක් ඔබ හමුවේ තැබීමයි. එබැවින් මෙය අවසානය තෙක් කියවා බලන ලෙස බුද්ධිමත් ඔබගෙන් "අපේ හෘදසාක්ෂිය" වෙනුවෙන් මුලින්ම ඉල්ලා සිටිමු.

දූෂණය සහ හෘදසාක්ෂිය

අනුර කුමාර දිසානායක ජ.වි.පෙ. නායක සහෝදරයා ට දූෂණ-වංචා පෙන්නන්නට බැරි බව පෙනේ. පසුගිය රෙජීමයේ පමණක් නොව "යහපාලන" ආණ්ඩුවේ දූෂණ-වංචා නිසා පවා අනුර සහෝදරයාගේ ලේ කකියයි. ඇත්තෙන්ම අනුර සහෝදරයාගේ හෘදසාක්ෂිය දූෂණ-වංචා ගැන කියන්නේ කුමක් ද?

අනුර සහෝදරයා නොකියා කියන්නේ දූෂණ-වංචා ගැන ඔවුන් හැර අනෙකුත් සියළු දෙනම වැරදිකරුවන් බවයි. එහෙත්, සත්‍යය ඊට හාත්පසින්ම වෙනස් ය. යහපාලන ආණ්ඩුවේ 2015-01-29 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් කලින් පැවති දූෂණ-වංචා ගැන සොයා බලන්නටත්, ඉදිරියේ දී දූෂණ-වංචා වැළැක්වීමටත් යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව දූෂණ-වංචා ගැන ක්‍රියා කරන්නට ඇමැති මණ්ඩල කමිටුවකුත්, දූෂණ විරෝධී කමිටුවකුත්, එම දූෂණ විරෝධී කමිටුවට සහාය වන්නට අනු කමිටුවකුත්, එතැනින් නොනැවතී දූෂණ ගැන සොයා, බලා වැටලීම් කරන්නට කඩා පනින හමුදාවක් වන "ක්ෂණික ප්‍රතිචාර කමිටුවකුත්" ස්ථාපිත කරන ලදී.

ඒ අනුව ඇමැති කමිටුවේ හැරුණු කොට සෙසු සියළුම කමිටුවල අනුර සහෝදරයා ජ.වි.පෙ.ය නියෝජනය කරමින් සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරනවා පමණක් නොව, කඩා පනින "ක්ෂණික ප්‍රතිචාර කමිටුවේ" මූලිකයා ද ලෙස ක්‍රියා කරයි. "ක්ෂණික ප්‍රතිචාර කමිටුවට" තමන් කැමති ඕනෑම රජයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් යොදවා ගෙන තොරතුරු ලද වහාම කඩා පැන දූෂණ-වංචා අල්ලා ගැනීමේ පර්ණ බලතල ඇත.

එහෙත්, අනුර කුමාර සහෝදරයා රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා සම්බන්ධ වූයේ යැයි කියන මහබැංකු බැඳුම්කර වංචා සිද්ධියේ දී තමන්ගේ බලය පාවිච්චි කර කඩා පැන එහි සිදුවූ දූෂණය හෝ වංචාව අල්ලා ගත්තා ද? රවි කරුණානායක ඇමතිවරයා සම්බන්ධ වූයේ යැයි කියන බදු නොගෙවා "කරුංකා" කන්ටේනර් නිදහස් කරගැනීම ගැන සිද්ධියේ දී අනුර සහෝදරයා කඩා පැන එහි සිදුවූ දූෂණය හෝ වංචාව අල්ලා ගත්තා ද? සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිවරයා සම්බන්ධ වූයේ යැයි කියන බදු නොගෙවා "තඹ" කන්ටේනර් නිදහස් කර ගැනීම ගැන සිද්ධියේ දී අනුර සහෝදරයා කඩා පැන එහි සිදුවූ දූෂණය හෝ වංචාව අල්ලා ගත්තා ද? නැත. රනිල් වික්‍රමසිංහගේ හෝ ඔහුගේ ගෝල-බාලයන් සම්බන්ධයෙන් ජ.වි.පෙ.ය නියෝජනය කළ අනුර සහෝදරයාගේ "හෘදසාක්ෂිය" නිහඬ වී ඇත. ඒ ගැන අනුර සහෝදරයාගෙන් ප්‍රශ්න කරන්නට බැරි තරමටම ටිල්වින්, ලාල්, විරිත, හඳුන්නෙත්ති සහ වසන්ත ඇතුළු සෙසු ජ.වි.පෙ. නායකයන්ගේ ද "හෘදසාක්ෂිය" නිහඬ වී ඇත.

එසේනම්, දූෂණ-වංචා ගැන අනුර ඇතුළු ජ.වි.පෙ. අනෙක් සහෝදරයන්ගේ ලේ කකියන්නේ, ඔවුන් ගිරිය පුප්පා ගෙන කෑ ගහන්නේ ඔවුන්ගේ හෘදසාක්ෂියට අනුව නොවේ. එවැනි පසුබිමක "දේශයේ හෘදසාක්ෂිය" වන්නට ඔවුන්ගෙන් එකෙකුට හෝ පුළුවන්දැයි ඔබේ හෘදසාක්ෂියට අනුව සිතා බලන්න.

දෙබිඩි චරිත සහ හෘද සාක්ෂිය

"හෘදසාක්ෂියක්" ඇති මිනිසා ට චරිත දෙකක් නැත. ඇතුළතින් ඉන්නා පුද්ගලයා පිටතින්ද පැහැදිලිව පෙනේ. එහෙත් "දේශයේ හෘදසාක්ෂිය" වන්නට ඉඩ ඉල්ලන ජ.වි.පෙ. නායක සහෝදරවරුන් ගේ චරිත විනිවිද පෙනෙන සුළුද? මේ පත්‍රිකාව දිගටම කියවා ගෙන ගොස් ඔබම තීරණය කරන්න.

අනුර සහෝදරයා

අනුර සහෝදරයා "යහපාලනය" පටන් ගන්නේ විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා එල්ල කරන අල්ලස් චෝදනාවක් හිසේ පළන්දා ගෙනය. චෝදනාව නම් අනුර සහෝදරයට යූ.ඇන්.පී. ය විසින් පසුගිය ජනාධිපතිවරණයේ දී රුපියල් මිලියන 25 ක් දුන් බවට කෙරුණු චෝදනාවයි. අනුර සහෝදරයා "ඇට කෙහෙල් කාපු උගුඩුවෙකු සේ" චෝදනාව මග ඇරියා මිස කෙළින් උත්තරයක් දුන්නේ නැත.

එසේම 2010 වසරේ ජනාධිපතිවරණයේ දී සරත් ෆොන්සේකා සිය ඡන්ද ව්‍යාපාරය සඳහා ජ.වි.පෙ.යට දුන් රුපියල් කෝටි 5 ක් අනුර සහෝදරයා සිය කාරයේ ඩිකියේ දමාගෙන පැලවත්ත ජ.වි.පෙ. කාර්යාලයට ගෙනැවිත් ඇත. එහි දී ෆොන්සේකාට සහය දෙන්නේ ප්‍රතිපත්තිමය වශයෙන් මිස මුදලට නොවන බව සෝමවංශ සහෝදරයා (සිරි අයියා) පැවසීමත් සමග අනුර සහෝදරයා මුදල් ටික ගෙදර ගෙන ගොස්,සීදුව පැත්තේ මාලිගාවක් වැනි ගෙයක් මිලදී ගත් බව කාට රහසක් වුවත් ජ.වි.පෙ. ප්‍රධානීන්ට නම් රහසක් නොවේ.

එසේම, ජ.වි.පෙ. නායකයන්ගේ තෙල්-කොලෙස්ටරෝල් බස්සා ගන්නට පැලවත්ත පක්ෂ මූලස්ථානයේ උඩ තට්ටුවේ තබා ඇති ලක්ෂ දෙකක් වටිනා "ට්‍රෙඩ්-මිල්" උපකරණය මිල දී ගත්තේද ෆොන්සේකාගේ ඡන්දයේ දී අලවන්නට ලබා දුන් පෝස්ටර් ලොරියක් කොළ බරට විකුණා බව ද රහසක් නොවේ. එපමණක් නොව පැලවත්ත පක්ෂ මූලස්ථානය හදන්නට "හොල්සිම්" බහු ජාතික සිමෙන්ති සමාගමෙන් නොමිලේ සිමෙන්ති පගාව ගෙන "හොල්සිම්" හි ජ.වි.පෙ. වාත්තීය සමිති අරගල දිය කර හැරි එක් නායකයෙකි, අනුර සහෝදරයා. එසේම "රොසෙල්" ටයිල් කොම්පැණියෙන් "ටයිල් පගාව" ගෙන්වා ගන්නට මොහු ද මූලිකත්වය ගෙන ක්‍රියා කළේය. අද "රෝසෙල්" ටයිල් සමාගමේ ජ.වි.පෙ. වාත්තීය සමිති නැත.

අද අනුර සහෝදරයා රනිල්-මලික්-මංගල ගේ සුවව කිකරු සුරතලා බව රහසක් නොවේ. දැන් මේ ඔහු සැරසෙන්නේ "අලියාගෙන්" ඉවත් වන ඡන්ද ටික ඩැහැගෙන යළිත් සභාග ආණ්ඩුවක් හදන්නට

''අලියාට'' මුක්කු ගසන්නටය. ඒ නිසාම ''රතුඅලියා'' ලේබලය පක්ෂයට අලවා දුන්නේද අනුර සහෝදරයාමය. අද අනුර සහෝදරයාට මාක්ස්වාදය පමණක් නොව බටලන්ද වධකාගාරයේ ජීවිත පූජා කළ සහෝදරවරුත්, යූ.ඇන්.පී. මිනීමරු ආණ්ඩුවෙන් දස වද දී, දත්-නියපොතු උගුල්ලා, පණ පිටින් බොරැල්ල කනත්තේ ගෑස් ආදාහනාගාරට දමා පුළුස්සා මරා දැමූ රෝහණ විජේවීර සහෝදරයාවත් මතක නැත. විජේවීර සහෝදරයාගේ ජීවිත පූජාවේ අර්ථය අනුර සහෝදරයා අද මකා දමා ඇත.

එබැවින්, දේශයේ හෘදසාක්ෂිය වන්නට පෙර අනුර සහෝදරයාට හෘදසාක්ෂියක් ඇත්දැයි ඔබේ හෘදසාක්ෂියට අනුව සිතා බලන්න.

ලාල් සහෝදරයා

කෙනෙකුගේ පුද්ගලික ජීවිතය ධනපති දේශපාලන පක්ෂවලට වැදගත් නැතත්, ''කාඩර් දේශපාලනයේ'' යෙදෙන ජ.වි.පෙ. වැනි පක්ෂයකට නම් විනය සහ පුද්ගලික ආදර්ශය තීරණාත්මක ලෙස වැදගත් වේ. එහෙත්, ලාල් සහෝදරා ගැන ඒ සම්බන්ධයෙන් හෙළිවන්නේ පිළිකුල් සහගත හෘදසාක්ෂියකි.

ලාල් සහෝදරයා ගේ මාක්ස්වාදය දැන් බේරෙන්නේ දිල්හානි අශෝකමාලා නමැති ඊයේ පෙරේදා සිට පක්ෂ පෙරහැරවල ඉදිරියෙන්ම වඩම්මාගෙන යන නිළියගේ රෙද්ද පල්ලෙන්ය. ලාල් සහෝදරයා ගේ විප්ලවය මේ ''දේදුන්නේ ආ සමනලී'' ගේ දෙපා පටන් ගන්නා තැන හිරවී ඇත.

එපමණක් නොවේ. ලාල් සහෝදරයා වැල්ලවායේ පක්ෂ ක්‍රියාකාරිකයෙකුගේ දියණිය වූ සචිනි ද බලන්නට නිතර වැල්ලවායට යයි. කලක් ලාල් සහෝදරයා ගේ විප්ලවය තිබුණේ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ දේශපාලන විද්‍යා කථිකාචාර්යවරියකගේ දෙතොල් අතරෙය. එසේම, අනුරාධපුර, 3 වන පියවරේ, නිශාන්ති ට ද ලාල් අයියාගෙන් ලැබෙන විප්ලවීය එස්.එම්.එස්. පණිවුඩ නිමාවක් නැත. එපමණක් නොවේ. කොළඹ ාදජනහරා (ඩොක්යාර්ඩ්) හි අද ජ.වි.පෙ. ාෘත්තීය සමිතිය ලාල් සහෝදරයා දියකර දමා ඇත. ඒ ඩොක්යාර්ඩ් පාලනාධිකාරියේ ''යමුනා'' නදියේ ලාල් අයියා ගිලී, නැහැවී ගිය නිසාය.

එපමණක් නොවේ. අනුරාධපුර, මාතලේ හන්දියේ, කුරුන්දන්කුලම පිහිටි ලාල් සහෝදරයා ගේ කම්කරු නායක දෙමහල් නිවස වායු සම්කරණය කර ඇත. ගේ හදන්නට සිමෙන්ති ''හොල්සිම්'' සමාගමෙනුත්, ටයිල් ''රොසෙල්'' ටයිල් සමාගමෙනුත් ලබාගැනීමේ පින ලාල් සහෝදරයාටද ලැබුණි. ඒවායේ ාෘත්තීය අරගල නැත. ඒ අරගල ලාල් අයියාගේත්, වසන්ත සමරසිංහ මල්ලිගේත් අලුත හැදූ ගෙවල්වල පොළොවේ සහ බිත්තිවල සැඟවී ගොස් ඇත.

ටිල්වින් සහෝදරයා

ටිල්වින් සහෝදරයා නිසා පෙරටුගාමීන් පක්ෂයෙන් කැඩී ගියා කීම වඩා නිවැරදිය. ඒ මධ්‍යම කාරක සභික දිමුතු ආටිගල සහෝදරයට ටිල්වින් අයියාගෙන් සිදු වූයේයැ යි කියන ලිංගික හිරිහැර ගැන මධ්‍යම කාරක සභාව විනය ක්‍රියාමාර්ගයක් නොගෙන මඟ හැරීමේ මූලික හේතුව නිසාය. එහෙත් ඒ මධ්‍යම කාරක සභාව අනුර පොල්ගම්පොල ගැන, එස්.අමරසිංහ සහෝදරයා ගැන වහාම විනය ක්‍රියා මාර්ග ගත්තේය. එය හොඳය. එහෙත්, ඒ හැන්ද ටිල්වින් සහෝදරයාට බෙදන්නට අතට නොගත්තේ අනෙක් අයගේ කිල්ලෝටවලත් හුණු තිබෙන බැවින් මිස වෙන කිසිවක් නිසා නොවේ.

විජිත සහෝදරයා

විජිත සහෝදරයා විප්ලවීය නායකයෙකුට සරිලන ලෙස ධනපතීන්ගේ හෝටල් ගුබ්බෑයම් වල රිංග රිංගා කණමදයා සේ බිබී ඇවිදින බවට පැලවත්ත පක්ෂ මූලස්ථානයට නම් රහසක් නොවේ. මේ මෑතකදී ''වෝටර්ස් එජ්'' නම් වූ දියවන්නාව අසල ඇති අති සුඛෝපභෝගී හෝටලයට ගොස් සූර් වී, පක්ෂ මූලස්ථානයේ කැබ් රථයෙන් තමා එහි ගිය බවද විජිත මල්ලිට අමතක විය. අන්තිමේ පැලවත්ත පක්ෂ මූලස්ථානයේ රියැදුරු ''ලාල් අයියා'' ට ''වෝටර්ස් එජ්'' එකට ගොස් විජිත මල්ලිට රථගාලේ ගාල් කොට තිබූ වාහනය සොයා දෙන්නට සිදු විය.

එබැවින්, දේශයේ හෘදසාක්ෂිය වන්නට පෙර අනුර සහෝදරයාට මෙන්ම ලාල් සහෝදරයාටත්, ටිල්වින් සහෝදරයාටත්, වසන්ත සහෝදරයාටත්, විජිත සහෝදරයාටත්, පුද්ගලික කොම්පැණිකාරයන්ගෙන් මුදල් ගත් බවට චෝදනා ඇති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාටත් හෘදසාක්ෂියක් ඇත්දැයි ඔබේ හෘදසාක්ෂියට අනුව සිතා බලන්න.

මායාදුන්නේ සහ පක්ෂ හෘදසාක්ෂිය

ජ.වි.පෙ. ජාතික ලයිස්තුවේ මුලින්ම ඉන්නා හිටපු විගණකාධිපති මායාදුන්නේ මහතා සී.එස්.එන්. රූපවාහිනිය සමඟ පැවති සාකච්ඡාවකදී ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ තමා ජ.වි.පෙ. ප්‍රතිපත්ති සමඟ සියයට සියයක් එකඟ නොවන බවයි. මීටත් වඩා පක්ෂයට ප්‍රසිද්ධියේ කළ හැකි නිග්‍රහයක් ජාතික ලැයිස්තු අපේක්ෂකයෙකුට තවත් නැත. එහෙත් අද පක්ෂ නායක සහෝදරවරු මේ ගැන ඉන්නේ ''කසාය බීපු ගොළුවන් සේ'' ය. ජීවිත පරිත්‍යාගයෙන් ගොඩ නැගූ පක්ෂයක් එක් පුද්ගලයෙකුට ප්‍රසිද්ධියේ බාල්දු කරන්නට ඉඩ දෙන තරමට අද ජ.වි.පෙ. නායකත්වට නියාළු වී ඇත.

අද දේශයේ හෘදසාක්ෂිය වන්නට පක්ෂයට හෘද සාක්ෂියක් ඉතිරිව නැත.

ඔබේ හෘදසාක්ෂිය

මීටත් වඩා කරුණු තිබුණත්, ඒවායෙන් සමහරක් ප්‍රසිද්ධියේ ලියන්නට තරම් බැර ඒවාය. සමහරක් ලියන්නට මේ පත්‍රිකාව ප්‍රමාණවත් නොවේ.

එහෙත්, හැකි පමණ ජනතා විමුක්ති පෙරමුණු නායකයන්ට හෘදසාක්ෂියක් නැති බව කියන්නට උවමනා කරුණු කිපයක් හෝ ඔබ වෙත ඉදිරිපත් කිරීම අපේ වගකීමක් ලෙස සලකා මේ ටික හෝ ඉදිරිපත් කරන්නට තීරණය කළෙමු. ඒ මන්ද යත් ඔවුන්ට නොමැති වුවත්, ඔබටත්, අපටත් හෘදසාක්ෂියක් සැබවින්ම ඇති බැවිනි.

එබැවින්, ජනතා විමුක්ති පෙරමුණට ''දේශයේ හෘදසාක්ෂිය'' වන්නට ඔබේ වටිනා ඡන්දය දෙන්නට පෙර ඔබේ ''හෘදසාක්ෂිය'' අවදි කර සිතා බලන මෙන් බුද්ධිමත් ඔබෙන් ඉල්ලා සිටිමු.

අපි,

ජනතා විමුක්ති පෙරමුණේ "සැබෑ හෘදසාක්ෂිය"